**ඉතිහාසය - 13 ශ්‍රේණිය**

**ශ්‍රී ලංකාවේ ඉතිහාසය - 08 වන පාඩම**

**දයාබර දූවේ පුතේ,**

ශ්‍රී ලාංකේය ශිෂ්ටාචාරයේ ඓතිහාසික විකාශනය හා ප්‍රවණතා පිළිබඳව ඔබ අවබෝධයෙන් සිටින බව අපගේ විශ්වාසයයි. එබැවින් ඔබගේ විෂය නිර්දේශයේ එන 08 වන පාඩම වූ ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම හා ස්ථාපිත වීම පාඩමට අදාළ සටහන් නැවත කියවා පහත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු ලිවීමට උත්සාහ කරන්න. ඔබට ජය නියතයි.

01) ඉංග්‍රීසීන් විසින් මෙරට මුහුදුබඩ පාලනය කළ ආකාර 3 දක්වන්න. (ල.03)

02) මුහුදුබඩ ප්‍රදේශවල බදු එකතු කිරීමට මදුරාසියෙන් ගෙන්වූ නිලධාරීන් හැඳින්වූ නාමය කුමක්ද? (ල.01)

03) මුහුදුබඩ ප්‍රදේශවල ඇතිවූ කැරැල්ලට හේතු විමසා බැලීමට මෙරටට පත්කොට එවූ මියුරන් කමිටුවේ යෝජනා 2 ක් ලියන්න. (ල.04)

04) 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණවල බලපෑම ක්‍රි.ව.1848 නිදහස් සටනට මඟ පාදන ලදී.මෙම ප්‍රකාශය විචාරාත්මකව විමසන්න. (ල.08)